

# සිනාවී



## සිනා සීනාවී

කුරවි කුරුල්ලෝ ගගන අරා සරති. ප්‍රීතියෙන් ප්‍රමුදිත ඔවුන්ගේ කූජන ලොව සනහාලන රසෝඝයක් වැන්න. දිය දම් දිනිතියගේ ආශිර්වා-දයෙන් ලත් නේක වර්ණ පියාපතින් සැරසීගත් ඔවුනගෙන් හැඩ වෙන්නේ ගගනත පමණක් ම නො වේ. වන පෙත් ද, ගං, හෝ, විල් ද ඒ පහසින් තරඟ නගයි.

නුහුරු රටකට පියඹා ආ සංක්‍රමණික විහඟ කැළක් ද වටපිටාවට අනුගතවන්නට මේ අතරේ යත්න දරති. ඇතැමුන් සංක්‍රමණය වූයේ සිය සුහුඹුලක් ද සමඟින්මයි ඒ සුහුඹුලන්ගෙන් ඇතැමෙක් මව්පිය උණුසුමින් සැනැහි තමන්ට හුරු දේ ගැයීමට තතනති. නිර්ව්‍යාජ හෙළ හඬකින් දොරට වැඩීමට නැකැත් සොයනා එවන් යොවුන් මයින කෙවිලියක ඒ සඳහා තෝරගන්නේ හෙළයේ සැණකෙළි මාසය වන බක් මාසයයි.

ඇය සරිනි දිසානායක නව යොවුන් දියණියයි. සිය මව්ගේ හඬින් හඬ අවුලවන ඇය, සිය සිනාවෙන් සුරතල් නමක් පට බැඳ ගන්නී, ඒ වෙනුවෙන්ම ලියවුණ පද පෙළකින් යුත් "සිනාවී" ගීය සමඟින් මෙවර "ගී සඳැළුව" ට පියාඹා එන්නීය. "සිනාවී" හු-දෙක් එක් ගීයකට පමණක් සීමා නොකර ගී




එකතුවක් කරගැන්මට ඇය සමත් වන්නේ විවිධ රටාවන්ට ගැයීමට ඇය දක්වන හුරුව මෙන් ම ලැදියාව නිසයි. ඒ වෙනුවෙන් ඇය දායාද කරගන්නේ සිය පිය පද'රුත්මයි. ඇය එක යුවලකගේ දියණියක නොවී අප කාගේත් දියණි යක සොයුරියක බවට පත් වන්නේ මෙල්බන් වෙසෙන ශ්‍රී ලාංකේය සම්භවයක් සහිත අපගේ සමාජ උප කුලකයේ කටයුතු හා විටින් විට බද්ධ වෙමින්.

සරිනි සිය මියැසි කුසලතාවය ලබා ගන්නේ උපතින්මයි. මව් කුසයේ දී පවා ඇය නිරතුරුව ඇසූ හෙළ ප්‍රවීණයන්ගේ ගී රසය මිටින් ගෙන උපදින ඇය අදටත් මව්ගේ ගායන සර පහසේ නැළැවෙන්නීය. දහම් පාසැල් ගායනා තරඟවලින් සහතික ගත කළ ඇයගේ හැකියාව ඇයව නුගේගොඩ "කළාභූමි" වෙත ගෙන යයි. ඒ ඇයගේ මලනුවන් ද සමගින්. ඔවුන්ලේ මුලින්ම මියැසි අදුරිඳු වන්නේ ආනන්ද වීරසිරි විශාරදවරයායි. මෙල්බන් නුවර දී වාසනා වීරකෝන් සංගීතාචාර්යරිය යටතේ ක්‍රමවත් ශාස්ත්‍රීය ගායනා-වන්වලට යොමුවන සරිනි ඉන්දියානු සම්භවයක් සහිත දීපිකා සංගීතාචාර්වරියගෙන් ද මියැසි සිප් හදාරන්නීය.

පසුගිය වසර දොළහක කාලය තුල සරිනි මෙල්බන් නුවර ඇතැම් අවස්ථාවන් සඳහා ඉදිරිපත් වුණ ද සිය ඉගෙනුමට මුල් තැන දෙන්නී ඉන් දිනා ට්‍රැෆික් ඉංජිනේරුවරියක් ලෙස සිය වෘත්තීය දිවිය අරඹන්නීය. නර්තනයෙන් ඇය මෙහෙය වූ රශිකා කුලසිංහ මෙන් ම විනීතා විජේරත්න, මාලිනී ජයසිංහ මහත්මීන්ව ද ඇය ගෞරවයෙන් සිහිපත් කරන්නීය.

"ගී සඳැළුව" ට පියාඹා ආ ඇයගේ මුල් ම ස්වතන්ත්‍ර ගීය වන "අපේ කඳුලැලි බින්දු" ගීය ආචාර්ය වික්ටර් රත්නායකන්ගේ මියැසි රටාවන්ට අනුව සරිනි ගැයුවේ ඇයගේ මලනුවන් වන පියත් සමඟින්. ඉනික්බිතව ආචාර්ය රෝහණ වීරසිංහයන් සංගීතවත් කළ " කරපිංචා කුරුපිංචී", "නෙරිය තියන්නේ කොහෙ-ාමද අම්මේ", ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්නයන්ගේ තනුවට හා අග්‍රා ප්‍රේමරත්නයන්ගේ සංගීතයට ගැයූ "ටිකිරි නංගියේ" සහ තරුපති මුණසිංහයන්ගේ සංගීතයට ගැයූ "අම්මේ රෝ රේ" ගීත අපගේ "අතුරු මිතුරු" ළමා ගීත සංගත තැටියට එක් විය. "නෙරිය තියන්නේ " ගීය විශාරද නන්දා මාලිනිය හා ගැයුමට ඇය වාසනාවන්ත වූවාය. "අතුරු මිතුරු" ඩෙන්සිල් ජයවීර මහත්මාගේ මූල්‍යමය අනුග්‍රහයෙන් යුතුව අප විසින් කළ නිශ්ප-ාදනයක් විය.

කාලයත් සමඟින් සරිනි ආ මියැසිමය චාරිකාවට දායක වන්නට අපටද වරම් ලැබිණ. මියැසියේදී ඇය අපගේ පන්ති මිතුරියක වූවාය. වාසනා වීරකෝන් ගුරුවරියගේ "සංඛ පද්ම" අසපුවේදී ගායනයටත්, විටින් විට කළ ගී නිර්මාණ සඳහා පද රචනයටත් දායක වෙමින් අප මෙතෙක් ආයේ සංසාරගත පුරුද්දක් නිසා ආ චාරිකාවක් දෝ යි සිතෙයි.

එකම හඬක් වෙනුවෙන් එකම පෑන් තුඩකින් ලියැවෙද්දී ඇති විය හැකි ඒකාකාරී බවින් මිදීමට අපි දෙදෙනාම උත්සාහ කළෙමු. අප දෙදෙනාටම එව සැබෑ අභියෝගයක් විය. කුඩා දැරිවියක සිය දිවියේ යොවුන් වියට එළැඹෙත්ම ක්‍රමයෙන් පරිණත වන හඬටත් සිතුම් පැතුම්වලටත් අනුගතව කාලයෙන් කාලයට ලියැවී හඬ කැවුන මේ ගී සමුච්චය ඒ ඒකාකාරී බවින් මිදී ඇතැයි සිතේ. ඒ ඒ වයසට අනුව අදහස් මෙන් ම වචන ද වෙනස් ආක-ාරයට ලියැවිණ. එකම කාලවකවානුවක කළ ගී වෙනුවෙන් ද තමන්ට හැකි පරිදි කටහඬ වෙනස් අන්දමට මෙහෙයවමින් ගැයීමට සරිනි ද උනන්දු වූවාය. ඇතැම් ඒවායේ ගායනා විලාශයන් ද එකකට එකක් වෙනස් විය. නිදසුනක් ලෙස ගී එකතුවේ තේමා ගීය වන "සිනා සිනාවී" ගීය සැළකුවහොත්, බටහිර ආරයේ තනුවකට අනුව ගැයුන මෙම ගීය ආයාසයෙන් බටහිර ඌරුවට උච්චාරණය කරමින් ගයන්නට ඇය උත්සාහ කළාය. එහි තනුව නිර්මාණය කළ සුරේෂ් මාලියද්ද තරුණ සංගීතවේදියාණන් ඊට පූර්ණ සහය ලබා දුන්නේය. සහන් රන්වලයන් ජන ගී නාද මාලාවන් ඇසුරින් නිර්මාණය කළ "දළදා තේවාවේ" ගීතය ගැයීමට ඇය රන්වල බලකායේ යෞවනියන් හා පුහුණු වී නියම ජන ගී හඬට අනුගත වූවාය. වාසනා වීර-කෝන් සංගීතාචාර්යවරිය තනුව නිර්මාණය කළ සරස්වතී අභිනන්දන ගීය ඇය ගයන්නේ උත්තර භාරතීය රාගධාරී සංගීත ක්‍රමවේදයන්ට සමවදිමින්. තරුපති මුණසිංහන්ගේ "අම්මී රෝ රේ" ආදි වාසී ගීය ඇයගේ වෙන මම ගැයුමකි.

මෙල්බන්හි දී හඬ මුසු කළ කැමරන් කොළඹගේ ශිල්පියාගේ තනුව, "සඳ සොඳුරු යාමයේ " ගීය ස්ව-ප්නයක ගැලී මුමුණන ආකාරයෙන් ගැයුණ අතර, ඉන්ද්‍රජිත් මිරිහාන ශිල්පියාගේ "ගුගල් ගුලාවේ " තනුව සිරසේ හඬ උපයෝගී කරගෙන උස් හඬින් සිරිනි ගයන්නේ විටින් විට හදවතේ හඬටද නොදැනීම මාරු වෙමින්. මේ අතරට එක් වන නාලක අංජන කුමාර යොවුන් සංගීතවේදියාණන්ගේ "අක්වැල්ලේ " ගීය ඇයට වෙනම තනුවකි. විශාරද අමරසිරි පිරිස් සංගීතවේදියාණන්ගේ තනුවට අනුව එතුමන් හා ගැයූ " පිපෙන්න" ගීය ද ඇය වෙනම ම පුහුණු වී කළ ගැයුමකි. ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ තනුවට අනුව ගැයූ ගී දෙකින් එකක් එතුමන් හා ගැයූ යුග ගැයුමක් වූ අතර, ඒ හඬ පටිගත කිරීම් සැබැවින්ම ඇයට මියැසියම වැඩමුළු සේ විය. විශාරද රෝහණ ධර්මකීර්ති සංගීතවේදියාගේ තනුවට විශාරද මනීෂ විජේකෝන් යොවුන් ගායන ශිල්පියා සමඟ ගීය ගැයීමේදී ඔහුගේ හඬ පරාසයට වෙන්න හඬ ලෙලැවීම්වලට අනුව තමන්ගේ ගායනාව ඉදිරිපත් කිරීමට සරිනිට සිදු විය. මහින්ද බණ්ඩාර නම් වූ සොඳුරු සංගීතවේදියාණන් සමඟ අපගේ වූ නිර්මාණාත්මක ගනුදෙනුව ඉතා සුහද වූවක් විය. ඒ නිසාවෙන් ම ගී එකතුවේ වැඩිම මියැසිමය දායකත්වය බණ්ඩාරයන්ගේයි. ඔහුගේ ගී තනු තුනෙන් එකක් නිරෙ-ා්ෂා විරාජිනිය ප්‍රවීන ගායන ශිල්පිනිය හා ගැයීමට සරිනි වාසනාව ලද්දීය. සහන් රන්වලයන් අප හා මුහුව කළ නිර්මාණය මෙතෙක් හෙළ ගී පුරාවතේ නොවූ ආකාරයේ නිර්මාණයකි. සැබැවින් ම ඒ සැහැල්ලක් ද ? සව්දමක් ද ? ගීයක් ද ? එසේත් නැතිනම් ඒ සියල්ලෙහි මුසුවක් ද? අඩිලයෙන් ගලා යන තනුවට අනුව ලියූ දිගු පද පෙළ සරිනි අනායාසයෙන් ගැයුවේ පෙර හුරුව නිසයි.

මෙලෙසින් ගත් කල ළදැරියකගේ පටන් යෞවනියක වන තුරු වයස පරාසයන්ට අනුව පරිණත වන විවිධ හඬ පරාසයන් වෙනුවෙන් ඊට ගැලපෙන අදහස් හා වචනවලින් යුත් පද රචනා එක් කිරීමට අපි උත්සහ කළෙමු. ඒ වෙනුවෙන් විවිධාකාර මියැසි රටා ඇද දුන් සියළු මියැසි ඇදියුරුවරුන්ටත්, යුග ගායනයෙන් විවිධ හඬ රටා මුහු කළ සියලු සංගීත ශිල්පී ශිල්පිනියන්ටත් අපගේ ප්‍රණාමය හිමි වෙයි. මියැසි මෙවලම් නද මිහි-රෙන් අවදි කළ සියළු වාද්‍ය ශිල්පීන්ටත් මේ සියළු දෑ තාක්ෂණය හා මුහු කරමින් ඉතිරි කරගත් සියළු ශබ්ද පරිපාලන ශිල්පීන්ටත් අපගේ ප්‍රනාමය හිමි වෙයි.

මේ ගී එකතුව එළි දැක්වෙන යොවුන් ගී ප්‍රසංග සඳළුව අප්‍රේල් මස 30 වන සෙනසුරාදා සවස 6.00ට රෝවිල් ප්‍රදේශයේ "හම්ප්‍රිස් ඇවනියු" මඟෙහි "රෝවිල් පර්ෆෝර්මිං ආර්ට් සෙන්ටර්" ශාලාවේදී අලෝකමත් වෙයි. එහිදී සරිනි ට අමතරව ගායන හා සිතාර් වාද්‍ය විශාරද මනීෂ වීර-කෝන්, හසිනි ඉලංගරත්න අශ්වින් දහනායක හංසිකා සඳලි ඩයස් සමග මහීෂ ගමගේ යො-වුන් යෞවනන් සිය ගී ගයමින් සඳළුව නිම් නාද කරවයි. සංක්‍රමණික මයින කෙවිලියකගේ දොරට වැඩීම වෙනුවෙන් සියළු පියාපත් රෝවිල් වෙත සැළෙනු ඇතැයි බලාපොරොත්තු වන්නෙමු. සරිනියගේ සිනාවන්ට සිනාවී මුහුවන්නට ඇයත් සමඟින් කරනා ලෙන්ගතු ඇරයුම සමඟින් මෙවර "ගී සඳැළුවේ" තිර වසාලන්නෙමු.

**සිනා සිනාවී**
**අපි ඉඳිමු සිනා වී**
**අලංකාරියේ - අලංකාරියේ**
**ඇයි**
**අහංකාර වී - අහංකාරියේ ?**

**ජීවිතේ අපේ**
**පිනි බිංදුවක් වගේ**
**ඇසිල්ලකින් යයි ගෙවී - ගෙවී**
**අරුණැල්ලෙ සිනා වී**
**අව් රැල්ලේ මියේ වී**
**ඒ නිමේෂයේ ඇයි දැවී - තැවී**

**යෞවනේ අපේ**
**පැණි බින්දුවක් වගේ**
**මලෙන් මලේ රොන් මැවේ මැවේ**
**විඳවන්න නම් නොවේ**
**විඳගන්නටයි සුවේ**
**මල් සිනාවලින් සිත් නැවේ - නිවේ .... !**

**ගායනය : සරිනි දිසානායක**
**සංගීතය : සුරේෂ් මාලියද්ද**
**රචනය : සිසිර දිසානායක**